දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

| | | |
|---|---|---|
| අමාත්‍යතුමා<br>அமைச்சர்<br>Minister | } | 2784832<br>2784807<br>2785617 |
| ලේකම්<br>செயலாளர்<br>Secretary | } | 2784812 |
| කාර්යාලය<br>அலுவலகம்<br>Office | } | 2785141-50<br>**Fax**: 2784846 |

ඊමේල්/–மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය<br>உமது இல.<br>Your No } ....................................

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**கல்வி அமைச்சு**

**Ministry of Education**

"ඉසුරුපාය" , ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
'இசுருபாயா' ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.


මගේ අංකය<br>எமது இல.<br>My No. } ED /1/1/6/DT/7/2012

දිනය<br>திகதி<br>Date } 2012. 05. 17

**චක්‍රලේඛ අංක - 2012/16**

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කොට්ඨාස භාර නියෝජ්‍ය/
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම රජයේ පාසල්වල විදුහල්පතිවරුන් වෙත

## බාහිර පාර්ශවයන් විසින් පාසල් දරුවන් සඳහා නාට්‍ය සහ චිත්‍රපට දර්ශන හෝ වැඩසටහන් පැවැත්වීම ප්‍රමිතිගත කිරීම

පාසල්වල නාට්‍ය හා චිත්‍රපට දර්ශන සහ වෙනත් සෞන්දර්ය සංදර්ශන පැවැත්වීම සඳහා බාහිර පාර්ශවයන් වෙතින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත නිරන්තරයෙන් ඉල්ලීම් ඉදිරිපත් වේ. එසේ ඉදිරිපත් වන ඉල්ලීම්වලට අදාල නිර්මාණ සලකා බැලීමේ දී සහ පාසල් පද්ධතියෙන් වාර්තා වන තොරතුරු සලකා බැලීමේ දී, මේවා බොහොමයක් කලාත්මක ප්‍රමිතිය අතින් මෙන් ම ආචාරධර්මීය හා සංස්කෘතිකමය වටිනාකම් අතින් ද පහළ මට්ටමක පවතින බැව් පෙනී යයි. අනෙක් අතට කලාත්මක වටිනාකම අතින් ඉහළ යැයි පොදු සමාජයේ පිළිගැනීමට ලක් වන කෘතීන් වුව ද, පාසල් පද්ධතියේ පිළිගත් ආචාරධර්ම හා මනෝවිද්‍යාත්මක වශයෙන් ළමුන්ට බලපාන සාධක අනුව පාසලට නුසුදුසු බැව් පෙනේ. තව ද සමහර පාර්ශ්වයන් කටයුතු කරන්නේ, පාසල් දරුවන්ට සේවයක් කිරීමේ අරමුණින් නො ව, හුදෙක් ම තම පුද්ගලික ලාභ ප්‍රයෝජන පිළිබඳ අවශ්‍යතාවන්ගෙන් පමණක් බව ද පෙනී ගොස් තිබේ.

පාසලක් තුළ යම් බාහිර පාර්ශ්වයක වැඩසටහනක් පැවැත්වීම සඳහා අවසර ලබා දීමට පදනම් වන එකම සහ අවසාන නිර්ණායකය වන්නේ, අදාල වැඩසටහන මගින් දරුවන්ට ලැබෙන අධ්‍යාපනික වටිනාකම පමණක් බැවින් මින් ඉදිරියට එවන් වැඩසටහන් පැවැත්වීම සඳහා අවසර ලබා දීම පහත නියම කරන ලද ප්‍රමිතීන් හා කොන්දේසීන්ට යටත්ව සිදු කිරීමට උපදෙස් දෙනු ලැබේ.

මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දින පටන්, **බාහිර පාර්ශ්වයන්ට පාසල්වල නාට්‍ය දර්ශන සඳහා අවසර ලබා දීම ප්‍රමිතිගත කිරීම** යන මැයෙන් 2010. 07. 15 දින නිකුත් කෙරුණු 2010/24 දරන චක්‍රලේඛය අහෝසි කෙරෙන අතර, මීට පෙර ලබා දී ඇති සියලු අවසරයන් ද අවලංගු කෙරේ.

### 1.0 මෙම වැඩසටහන් පැවැත්වීම සඳහා අනිවාර්ය පොදු කොන්දේසි

1.1 සියලු නිර්මාණයන් පාසල් පද්ධතියේ පිළිගත් වටිනාකම්වලට හානිකර නොවිය යුතු වේ.

1.2 සංස්කෘතික හා සාමාජීය වශයෙන් නොගැලපෙන භාෂා ව්‍යවහාරයන්ගෙන් තොර විය යුතු ය.

1.3 මත්ද්‍රව්‍ය හා දුම්වැටි භාවිතයන්, ඝාතනයන් හෝ වධ හිංසා පැමිණවීම්වලට අදාල ප්‍රචණ්ඩකාරී දර්ශන, ගෘහස්ථ හිංසනයන් සහ ලිංගිකත්වය ඉස්මතු කොට පෙන්වන දර්ශන ඉදිරිපත් නොකළ යුතු ය.

1.4 ඉදිරිපත් කෙරෙන වැඩසටහන්වල තේමාවන් / කතා වස්තූන් / ගී පද මාලා / දෙබස් ආදිය ජාති, ආගම්, කුල භේදවලට හා වෙනත් සමාජ විරෝධී අරමුණුවලට තුඩු නොදෙන එවැනි අදහස් ගම්‍ය නොවන ඒවා විය යුතු අතර, එවන් අදහස් ගම්‍ය වන පරිදි අර්ථකථනය නො කළ යුතු ය.

1.5 තමන් අයත් වන හෝ නියෝජනය කරන ජාති, ආගම්, සංස්කෘතික හා දේශපාලනික මතිමතාන්තර හෝ ප්‍රතිපත්තීන් හේතුකොටගෙන කිසියම් පුද්ගලයෙක්, ආයතනයක් හෝ සමාජ කොට්ඨාසයක් අපහසුවට පත් විය හැකි ආකාරයේ ඉදිරිපත් කිරීම් ඇතුළත් නොවිය යුතු ය.

1.6 චිත්‍රපට හා නාට්‍ය දර්ශන සඳහා නම් ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලයේ සහතිකය ලබා තිබීම අනිවාර්ය වේ.

1.7 තමන් ඉදිරිපත් කරන නිර්මාණයේ මුල් කෘතිය/නිර්මාණයන් තමන්ට අයත් නො වේ නම්, තමන්ට ඒවා ඉදිරිපත් කිරීමට ඇති හැකියාවේ නීත්‍යානුකූල බව සනාථ කළ යුතු ය.

## 2.0 පාසල්වල ඉදිරිපත් කිරීම සඳහා වැඩසටහන්වලට අවසර ලබා දීමේ ක්‍රියාවලිය

අදාල අවසර ලබා දීම් සඳහා මෙම චක්‍රලේඛයෙහි සඳහන් ප්‍රමිතීන්ට අනුකූල වන නිර්මාණයන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කෙරෙනු ලබන පහත සඳහන් අගැයීම් කමිටුවලින් එකකට ඒ ඒ ප්‍රමිතීන් අනුව ඉදිරිපත් කෙරේ.

2.1 **අභ්‍යන්තර අගැයීම් කමිටුව:-**

සාමාජිකයන් පස් දෙනෙකුගෙන් යුතු මෙම අගැයීම් කමිටුවේ සංයුතිය පහත පරිදි ය.

| | |
|---|---|
| අධ්‍යක්ෂ (සෞන්දර්ය අධ්‍යාපන) | සභාපති |
| අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (ආගමික හා සාරධර්ම අධ්‍යාපන) | සාමාජික |
| අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (තාක්ෂණ අධ්‍යාපන) | සාමාජික |
| අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (විෂය සමගාමී/ මාර්ගෝපදේශන හා උපදේශන) | සාමාජික |
| සහකාර/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (නාට්‍ය හා රංග කලාව) | ලේකම්/ සම්බන්ධීකාරක |

2.2 **විශේෂඥ අගැයීම් කමිටුව :-**

සාමාජිකයන් හත් දෙනෙකුගෙන් යුතු මෙම අගැයීම් කමිටුවේ සංයුතිය පහත පරිදි ය.

| | |
|---|---|
| අධ්‍යක්ෂ (සෞන්දර්ය අධ්‍යාපන) | සභාපති |
| විශ්වවිද්‍යාල, රාජ්‍ය මාධ්‍ය ආයතන, ජාතික නාට්‍ය අනුමණ්ඩලය, ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය සහ ජාතික අධ්‍යාපන ආයතනය යන ආයතනවල කටයුතු කරන හෝ කටයුතු කළ පිළිගත් බාහිර විෂය විශේෂඥයන් පස් දෙනෙක් | සාමාජික |
| සහකාර/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (නාට්‍ය හා රංග කලාව) | ලේකම්/ සම්බන්ධීකාරක |

## 3.0 අභ්‍යන්තර අගැයීම් කමිටුවේ අගැයීමට ඉදිරිපත් කෙරෙන වැඩසටහන්

3.1 රජය විසින් ඕනෑම වර්ෂයක දී පවත්වන ලද සහ දැනට පවත්වනු ලබන පහත නාට්‍ය උළෙලවල හෝ තරඟවල අවසාන වටය හෙවත් ජාතික මට්ටම නියෝජනය කිරීමට අවස්ථාව ලද නාට්‍ය.

අ) අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පැවැත්වූ **සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා තරඟය** සහ මේ වන විට පවත්වනු ලබන **සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙල.**

ආ) අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පවත්වන **රාජ්‍ය පාසල් නාට්‍ය උළෙල.**

ඇ) සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් පවත්වන **රාජ්‍ය ළමා නාට්‍ය උළෙල.**

ඇ) අධ්‍යාපන අමාත්‍යාංශය සහ ටවර් හෝල් රඟහල පදනම එක්ව සංවිධානය කරන **සමස්ත ලංකා පාසල් ටවර් හෝල් නාට්‍ය තරගය.**

3.2 මේ වන විට පාසල්වල ඕනෑම මාධ්‍යයකින් ඉගැන්වෙන නාට්‍ය හා රංග කලාව, භාෂාව හා සාහිත්‍යය යන විෂයමාලාවන් හි සහ පෙළ පොත්වල නිර්දේශිත විදේශීය නාට්‍යවල නිෂ්පාදන සහ දේශීය නාට්‍යකරුවන්ගේ ස්වතන්ත්‍ර නාට්‍යවල නිෂ්පාදන.

3.3 මීට පෙර පාසල්වල ඕනෑම මාධ්‍යයකින් උගන්වනු ලැබූ, නාට්‍ය හා රංග කලාව, භාෂාව හා සාහිත්‍යය යන විෂයමාලාවන් හි සහ පෙළ පොත්වල නිර්දේශිත විදේශීය නාට්‍යවල නිෂ්පාදන සහ දේශීය නාට්‍යකරුවන්ගේ ස්වතන්ත්‍ර නාට්‍යවල නිෂ්පාදන.

## 4.0 විශේෂඥ අගැයීම් කමිටුවේ අගැයීමට ඉදිරිපත් කෙරෙන වැඩසටහන්

4.1 රජය විසින් ඕනෑම වර්ෂයක දී පවත්වන ලද සහ දැනට පවත්වනු ලබන පහත නාට්‍ය උළෙලවල හෝ තරගවල අවසාන වටයෙහි හෙවත් ජාතික මට්ටමෙහි හොඳම නිෂ්පාදනය, හොඳම නාට්‍යය 1, 2, 3 යන ස්ථාන ලද නාට්‍ය.

අ) සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් පවත්වන **රාජ්‍ය නාට්‍ය උළෙල.**

ආ) සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් පවත්වන **රාජ්‍ය කෙටි නාට්‍ය උළෙල.**

ඇ) ජාතික තරුණ සේවා සභාව මගින් පවත්වන **යෞවන සම්මාන නාට්‍ය උළෙල.**

4.2 දැනට ක්‍රියාත්මක නාට්‍ය හා රංග කලා විෂයමාලාවන්හි රස වින්දනාත්මක හා ප්‍රායෝගික කොටස්වලට සෘජුවම අදාල වන ලෙස හෝ විෂය දැනුම පෝෂණය කරන ආකාරයෙන් සැකසූ වැඩමුළු ආශ්‍රිතව රඟ දක්වන නාට්‍ය.

4.3 වෙනත් රජයේ හෝ රජය පිළිගත් ආයතන මගින් සිදු කරන යම් ප්‍රවර්ධනාත්මක අරමුණු පදනම් කර ගත් (නිද. මත් ද්‍රව්‍ය නිවාරණ, සෞඛ්‍ය, පරිසර යනාදී) නාට්‍ය.

4.4 ප්‍රදර්ශන අවසරය සඳහා ඉල්ලීම් කරන සියලු චිත්‍රපට

4.5 දේශීයව සහ ජාත්‍යන්තරව සම්භාවනාවට සහ සම්මානයට පත් කලාකරුවන්ගේ නාට්‍ය හා චිත්‍රපට නිර්මාණ

## 5.0 සුදුසුකම් සපුරන වැඩසටහන් පාසල්වල ප්‍රදර්ශනයට අයදුම් කිරීමට අදාල වෙනත් කොන්දේසි

5.1 නාට්‍ය දර්ශන සඳහා අවසර ඉල්ලීමේ දී නාට්‍යයේ පිටපත් තුනක් සමග, ඉහත ප්‍රමිතිගත සුදුසුකම් පිලිබඳව අදාල ආයතන විසින් සහතික කරවාගත් ලේඛන සහ සහතික ද අනිවාර්යයෙන් ම ඉදිරිපත් කළ යුතු වේ.

5.2 චිත්‍රපට දර්ශන සඳහා අවසර ඉල්ලීමේ දී **'පාසල් ප්‍රදර්ශන අනුමැතිය සඳහා ඉදිරිපත් කෙරෙන පිටපතකි'** යන ප්‍රකාශය තිරය මත ස්ථිරව දිස් වන පරිද්දෙන් සැකසූ සී. ඩී. හෝ ඩී. වී. ඩී තැටි තුනක් අදාල අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු වේ. නැතහොත් අගැයීම් මණ්ඩල සාමාජිකයන් සඳහා විශේෂ දර්ශනයක් සංවිධානය කළ යුතු වේ.

5.3 පාසලේ ඉගැන්වෙන නාට්‍ය හා රංග කලාව විෂය මාලාව පදනම් කොට සැලසුම් කළ වැඩමුළු හා ආශ්‍රිත නාට්‍ය දර්ශන මෙන්ම වෙනත් සෞන්දර්යාත්මක වැඩමුළු පැවැත්වීමේ දී අදාල පාර්ශ්වයන්, සිසුන්ට හා ගුරුවරුන්ට එවන් වැඩසටහන් පැවැත්වීමට තරම් ක්ෂේත්‍රයෙහි අත්දැකීම් සහිත, විෂය ප්‍රවීණතාවයෙන් යුතු, අධ්‍යාපනික සුදුසුකම්වලින් පරිපූර්ණ අයවලුන් වීම අනිවාර්ය ය. ඔවුන්, එබඳු වැඩමුළු පැවැත්වීම සඳහා තමන්ට පවතින එම සුදුසුකම් ද ලිඛිතව සනාථ කළ යුතු ය.

5.4 විශේෂඥ අගැයීම් කමිටුවට ඉදිරිපත් කිරීමට නියමිත වන වැඩසටහන් සඳහා පහත සඳහන් පරිදි, ආපසු නොගෙවනු ලබන සමීක්ෂණ ගාස්තුවක් ගෙවීම අනිවාර්යය වේ.

| වැඩසටහන් | සමීක්ෂණ ගාස්තුව |
|---|---|
| චිත්‍රපට | රු. 10,000.00 |
| නාට්‍ය හා ඒ ආශ්‍රිත | රු. 5,000.00 |

5.5 මෙම අමාත්‍යාංශයේ සරප් වෙත සමීක්ෂණ ගාස්තුව ගෙවා ලබා ගන්නා රිසිට්පතේ පිටපතක් ද අයදුම්පත සමග අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතු වේ. (සමීක්ෂණ ගාස්තු ගෙවීම, සමීක්ෂණ කටයුතු සඳහා මිස අවසර ලබා දීම සඳහා අදාල නො වේ.)

**6.0 අමාත්‍යාංශයීය අවසරය ලබා දීමට සහ අවසර ලත් වැඩසටහන් ඉදිරිපත් කිරීමට අදාල කොන්දේසි**

6.1 ඉහත අගැයීම් කමිටු නිර්දේශ අනුව පාසල්වල ප්‍රදර්ශනයට සුදුසුකම් සපුරන වැඩසටහනක් ඕනෑම රජයේ පාසලක ඉදිරිපත් කිරීමට නම් මෙම අමාත්‍යාංශයේ අවසර ලිපිය අනිවාර්ය වේ.

6.2 මෙම අවසරය ලබා දෙන්නේ ද එක් ලිත් වර්ෂයක් සඳහා පමණක් වන අතර එය ද අදාල වර්ෂයේ පළමුවන හා දෙ වන පාසල් වාරයන්ට පමණක් සීමා වේ.

6.3 මෙම නිර්මාණ වේදිකාගත කිරීම හෝ තිරගත කිරීම කළ යුත්තේ පාසල් කාල වේලාවෙන් පසුව පමණි.

6.4 අවසර ලබා දුන් වැඩසටහනක් සම්බන්ධයෙන් වුව ද පාසල් පද්ධතියෙන් පැමිණිලි හා චෝදනා ඉදිරිපත් වේ නම්, කරුණු පිරික්සා බලා ඕනෑම මොහොතක එම අවසරය අවලංගු කරනු ලැබේ.

6.5 අවසරය ලබාගත් වැඩසටහනක් යම් පළාතක පළාත් සභාව මගින් පාලනය වන පාසලක ඉදිරිපත් කරන්නේ නම් අදාල පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ලබා ගත යුතු ය.

6.6 එම යම් පාසලක ඉදිරිපත් කිරීමේ දී අදාල පාසලේ විදුහල්පතිගේ පූර්ණ එකඟතාවය, වගකීම හා අධීක්ෂණය යටතේ පමණක් සිදු කළ යුතු ය.

6.7 එය පාසල තුළ ඉදිරිපත් කිරීම මගින්, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට මෙන් ම එහි විනයට ද කිසිදු ආකාරයක බාධාවක් ඇති නොවිය යුතු අතර ඒ ආශ්‍රිතව පාසලට අදාල චක්‍රලේඛ, නීති රීති, ව්‍යවස්ථා හා මූල්‍ය පරිපාටීන් කිසිවක් ද උල්ලංඝනය නොවිය යුතු ය.

6.8 වැඩසටහන සඳහා දරුවන්ගෙන් මුදලක් අය කරන්නේ නම්, ඉතා සාධාරණ සහන මුදලක් ප්‍රවේශ පත්‍රයක් සඳහා අය කළ යුතු අතර එම මුදලින් සියයට දහයක් අනිවාර්යයෙන්ම අදාල පාසලේ පාසල් සංවර්ධන සමිති ගිණුමට බැර කළ යුතු ය.

6.9 ප්‍රවේශ පත්‍ර මිල දී ගැනීම සඳහා සිසු දරු දැරියන්ට හා දෙමාපියන්ට බල කිරීම සපුරා තහනම් ය.

6.10 දර්ශනය සඳහා අදාල ශාලාවට සිසු දරු දැරියන් ඇතුළත් කිරීමේ දී, කිසිදු අපහසුවකින් තොරව ශාලාව තුළ රැඳිය හැකි ප්‍රමාණය පමණක් ඊට ඇතුළු කර ගත යුතු අතර ශාලාව තුළ අධික තදබදයක් ඇති වන පරිදි ඔවුන් ඇතුළු කිරීමෙන් වැලකිය යුතු ය.

6.11 චිත්‍රපට දර්ශන පැවැත්වීමේ දී, තාක්ෂණික අතින් එහි ශ්‍රව්‍යමය හා දෘශ්‍යමය ගුණාත්මක භාවය ඉහළ මට්ටමින් පැවතීම අනිවාර්ය වේ.

මෙම චක්‍රලේඛයෙහි කොන්දේසිවලින් ආවරණය නො වන යම් කරුණක් වේ නම් ඒ පිළිබඳ අවසාන තීරණය අධ්‍යාපන ලේකම් සතු වේ.

එච්. එම්. ගුණසේකර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය